ATTORNEYS-AT-LAW
COLOMBO

# කොළඹ දිසා අධිකරණයේ දී ය

නිශාල් ශ්‍රී අමරසේකර
167/4, ශ්‍රී විපුලසේන මාවත
කොළඹ 10.

පැමිණිලිකරු.

නඩු අංකය: 19849/එම්ආර්.

- එදිරිව -

ගාමිණී ලක්ෂ්මන් පීරිස්
විසුම්පාය, ස්ටේප්ල්ස් වීදිය
කොළඹ 2 සහ
අංක 37, සිරුල පෙදෙස
කොළඹ 5.

විත්තිකරු.

1998 මාර්තු මස 06 වන දින දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයින් වූ 'පෝල් රත්නායක ඇසෝසියේට්ස්' යන නාමධාරී විලාශයෙන් හවුල් ව්‍යාපාර කටයුතු කරන පේලිස් හෙන්රි පෝල් රත්නායක සහ උස්වත්ත ලියනගේ සුදත් තිලුපුල් ප්‍රසාංග පෙරේරා සහ ඔවුන්ගේ සහායකයන් වන පුෂ්පකාන්ති නවරත්න මෙනෙවිය, ශලින්ද්‍රි ජයසිංහ මිය, ඉන්ද්‍රාලෝජිනී රාජගෝපාලන් මෙනෙවිය, චන්ද්‍රානි සූරියආරච්චි මෙනෙවිය, කෝලිත සුසන්ත බණ්ඩාර වීරේරත්න මහතා, අමාලි දීපානි අලව්ව මෙනෙවිය, රුවිරා ඇන්තනි මෙනෙවිය සහ ප්‍රසන්න ද සිල්වා මහතා මගින් පෙනී සිටින ඉහත නම් සඳහන් විත්තිකරුගේ විරෝධතා ප්‍රකාශයෙන් මෙසේ ප්‍රකාශ කර සිටී:-

01. විත්තිකරුගේ ලියාපදිංචි නීතිඥවරුන් මගින් විත්තිකරුට භාර දෙන ලද උද්දේශිත විචාරණවලට (ඉන්ටෙරගේටරීස්) පිළිතුරු දීමට පහත දැක්වෙන හේතු නිසා විත්තිකරු නීතියෙන් බැඳී නැති බවට විත්තිකරුට උපදෙස් ලැබී ඇති බව විත්තිකරු ප්‍රකාශ කරයි.

02. එකී උද්දේශිත විචාරණ නඩුවේ කාර්ය සඳහා සද්භාවයෙන් ඇතුළත් කර නැති බව විත්තිකරු ප්‍රකාශ කරයි.

03. එකී උද්දේශිත විචාරණ එහි දක්වා ඇති කාර්ය සඳහා අසද්භාවයෙන් සහ/හෝ බාහිර හේතු නිසා ඉදිරිපත් කර ඇති බව විත්තිකරු ප්‍රකාශ කරයි. 1998.3.1 වන දින 'සන්ඩේලීඩර්', 'සන්ඩේ ටයිම්ස්' සහ 'රාවය' පුවත්පත්වල සත්‍ය පිටපත් විත්තිකරු විසින් පිළිවෙලින් 'වී1', 'වී2' සහ 'වී3' යනුවෙන් ලකුණු කර මෙහිම කොටසක් ලෙස අයැද සිටී.

04. වෙනත් හේතු අතර වූ පහත දැක්වෙන හේතු අනුව පැමිණිලිකරු මේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමෙහි ලා ප්‍රමත්තය නිසා වරදකරු වන බව සහ/හෝ අතිසි ප්‍රමාදයක් සිදු කරන බව විත්තිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරයි:-

( අ ) නඩුව පවරන ලද්දේ 97.7.21 වන දින දී ය.

(ආ ) විත්තිකරුට සිතාසි භාර දෙන ලද අතර සිතාසි ආපසු එවිය යුතු දිනය 97.10.31 වන දිනය විය.

( ඇ ) මේ නඩුව ශ්‍රැතිකරම් ත්‍රස්මණිත් විභාග කර තීරණය කළ හැකිවීම සඳහා සිතාසි ආපසු එවිය යුතු දිනයේ දී විත්තිකරු උත්තරය ඉදිරිපත් කළේ ය.

( ඈ ) නඩුව නඩු විභාගය සඳහා නියම කිරීමට 97.11.17 වන දින කැඳවන ලදි.

( ඉ ) නඩුව නැවත වරක් 97.11.24 වන දින කැඳවන ලද අතර එම දිනයේ දී එය 98.3.16 වන දින විභාග කිරීමට නියම කරන ලදි.

( ඊ ) උද්දේශිත විචාරණ 98.2.23 වන දින ඉදිරිපත් කරන ලද අතර 98.2.25 වන දින ඒවා ලියාපදිංචි නීතිඥවරුන් වෙත භාර දෙන ලදි.

( උ ) යටත් පිරියෙයින් විචාරණ 236 ක් ඇත.

05. උද්දේශිත විචාරණ ඉදිරිපත් කර ඇත්තේ නඩුව 98.3.16 වන දින විභාගයට ගැනීම වැළැක්වීමට බව වෙනත් කරුණු අතර විත්තිකරු ප්‍රකාශ කරයි.

06. එකී උද්දේශිත විචාරණ අදාළ නොවන බව විත්තිකරු තවදුරටත් ප්‍රකාශ කරයි.

07. විත්තිකරුට භාර දෙන ලද එකී ප්‍රශ්න සිවිල් නඩු විධාන සංග්‍රහයේ විශේෂයෙන් එහි 16 වන පරිච්ඡේදයේ අර්ථානුකූලව විචාරණ නොවන බවත් එසේ විචාරණ යැයි සැළකිය නොහැකි බවත් විත්තිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

08. කෙසේ වුවත් එකී උද්දේශිත විචාරණ මේ නඩුවේ කාර්ය සඳහා වැදගත් නොවන බව විත්තිකරු ප්‍රකාශ කරයි.

09. මේ නඩුවේ අවස්ථාගත කරුණු අනුව කොයෙකුත් විචාරණ තිබිය අනුව අපකීර්තිමත් බව විත්තිකරු ප්‍රකාශ කරයි.

10. එකී උද්දේශිත විචාරණ අසාධාරණ ලෙස සහ/හෝ පීඩාකාරී ලෙස කරදී ඇති බව විත්තිකරු ප්‍රකාශ කරයි.

11. එකී උද්දේශිත විචාරණ අනිසි ලෙස දීර්ඝ බව විත්තිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

12. මේ අවස්ථාගත කරුණු අනුව එකී උද්දේශිත විචාරණවලට පිළිතුරු දීමට විත්තිකරු නීතියෙන් බැඳී නැති බවට විත්තිකරුට උපදෙස් ලැබී ඇති අතර විත්තිකරු එසේ ප්‍රකාශ කරයි.

එමනිසා විත්තිකරු අයැද සිටින්නේ:-

(අ) එකී උද්දේශිත විචාරණවලට පිළිතුරු දීමට විත්තිකරු නීතියෙන් බැඳී නැත;

(ආ) නඩු ගාස්තු; සහ

(ඇ) සුදුසුයැයි ඔබතුමාගේ ගරු අධිකරණයට පෙනී යන වෙනත් සහ වැඩිදුර සහන

ලබා දෙන ලෙසත් ය.

විත්තිකරුගේ ලියාපදිංචි නීතිඥවරු.

<u>අමුණා ඇති ලේඛන:</u>

01. සන්ඩේ ලීඩර් පුවත්පතේ සත්‍ය පිටපත - වී1

02. සන්ඩේ ටයිම්ස් පුවත්පතේ සත්‍ය පිටපත - වී2

03. රාවය පුවත්පතේ සත්‍ය පිටපත - වී3

<u>පිළියෙළ කරන ලද්දේ:</u>

නීතිඥ හර්ෂ අමරසේකර මහතා
ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා
විසිනි.